## මැතිවරණය හා අනාගතය
## (පසුගිය සතියේ ලිපියෙන් ඉතිරි කොටස)

පසුගිය මැතිවරණය පණස්හයේ දරුවන්ගේ මැතිවරණය ලෙස අප විසින් හඳුන්වනු ලැබුයේ මැතිවරණයට පෙර ය. ඇතැමුන් අපේ ලිපි උඩින්පල්ලෙන් කියවීම අපට ඉවසිය හැකිවුවත් උඩින්පල්ලෙන් කියවා එවාට ඊනියා පිළිතුරු දීමට කැසකැවීම නම් අශෝභන ක්‍රියාවකි. අප පණස්හයේ දරුවන් ලෙස හඳුන්වන්නේ ජ වි පෙ පමණක් නොවන බව අපේ ලිපි සංයමයෙන් කියවන්නෝ දනිති. පණස්හයේ දරුවන් පිළිබඳ නිර්වචනය කෙරුණේ ඒ සංකල්පය ඉදිරිපත් කෙරුණු දිනයේ දීම ය. එනම් 1989 පැවැත්වූ පළමු බණ්ඩාරණායක සමරු දෙසුමෙහි දී ය. ඒ දෙසුම සංවිධානය කෙළේ අද අගමැති පදවියට පත් වී සිටින පණස්හයේ දරුවකු වූ මහින්ද රාජපක්ෂ මහතා ය. පණස්හයේ දරුවකු වීමට එක් සුදුසුකමක් වනුයේ පණස්හයේ දේශපාලන පෙරළියෙන් යම් ආශ්වාදයක් හා පන්නරයක් ලබා තිබීම ය. පණස්හයේ ජාතිකත්වයක් තිබු බව අමුතුවෙන් කිවයුතු නො වෙයි. පණස්හයේ දරුවන්ට වත්මන් බටහිර කළමණාකරණය හෝ ක්වොන්ටම් භෞතිකය හෝ දැනගැනීමට (කටගාගැනීමට ද හැකි ය. ක්වොන්ටම් භෞතිකය ගැන මෙලෝ හසරක් නොදන්නා අය විද්‍යාවේ දර්ශනය ගැන පම්පෝරි ගසන රටක අර කටගාගත්තවුනට ද ඔවුන්ගේ පිහිටෙන් ක්වොන්ටම් භෞතිකය ගැන විශාරදයන් විය හැකි ය.) නොහැකි යැයි හෝ එසේ දැනගත් පමණින් ඔවුන් වෙනත් වර්ෂයක දරුවන් වන්නේ යැයි හෝ නො කියැවෙයි. යමකු යමක් ගැන කතාකිරීමට පළමු අඩුම තරමින් එහි නිර්වචනයවත් දැනගත යුතු ය. පසුගිය ලිපි සිහියෙන් කියවුයේ  නම් නිර්වචනය දැනගත හැකි වනු ඇත.

මැතිවරණයේ දී තරඟ කළ ජාතික හෙළ උරුමය පිළිබඳ ව ද අප ලියා ඇත. ඒ ලිපි හතරක් මැතිවරණය සහ හාමුදුරුවෝ යන මැයෙන් පොත් පිංචක් ලෙස එළි දැක්වී ඇත. ජාතික හෙළ උරුමයෙහි කොටස් දෙකක් ඇති බව ඒ ලිපිවල සඳහන් වෙයි. ඒ ගිහියන් හා භික්ෂුන් වහන්සේ ලෙස නො වෙයි. ලිපි උඩින්පල්ලෙන් කියවන්නෝ එවැනි නිගමනවලට ද එති. ජාතික හෙළ උරුමය බිහිකිරීමට මුල් වුයේ සිහල උරුමය නො වෙයි. ඒ බව ඉරිදා දිවයින සංග්‍රහයෙහි කොළොන්නාවේ සුමංගල හිමියන්ගේ හා උඩුවේ ධමමාලෝක හිමියන්ගේ සාකච්ඡාවලින් හෙළි වෙයි. ජාතික හෙළ උරුමයට මුල් වී ඇත්තේ එතරම් අල්පේච්ඡ ජීවිත ගත කරන්නේ යැයි කිව නොහැකි මේ විචිත්‍ර ධර්ම කථික භික්ෂුන් වහන්සේ දෙනම ය. උන්වහන්සේ පසුව ඒ පිළිබඳ ජාතික භික්ෂු සම්මේලනය සමග සාකච්ඡා  කර ඇත. මේ සම්මේලනයේ ද කොටස් දෙකක් වෙයි. එක් කොටසක වුයේ එල්ලාවල මේධානන්ද හිමියන් හා ඕමල්පේ සෝභිත හිමියන් ය. අනෙක් කොටසෙහි සංවිධාන ශක්තිය විය. ඒ කොටසට අයත්වුයේ අතුරලියේ රතන හිමි, රජවත්තේ වප්ප හිමි අද්දිහු ය. මේ හිමිවරු කෙලින් ම සිහළ උරුමය හා සම්බන්ධ වුහ. කෙසේ හෝ වේවා  විචිත්‍ර ධර්ම කථිකයන් වහන්සේලාගේ මතයට එල්ලාවල මේධානන්ද ආදී හිමිවරු විරුද්ධ වුහ. නාම යෝජනා පත්‍ර භාරදීමට සතියකට කලින් ද  මේධානන්ද හිමියෝ භික්ෂුන්වහන්සේ මැතිවරණයට ඉදිරිපත් වීමට විරුද්ධ ව උන්වහන්සේගේ මතය ප්‍රකාශ කළහ. එහෙත් යම් හේතුවක් නිසා මේ සියළු විරුද්ධතා මගහැරී ගියේ ය. එයට හේතුවක් ලෙස පෙන්වන්නේ භික්ෂුන් වහන්සේ පාර්ලිමේන්තුවේ කරන්නේ වෙනම දේශපාලනයක් යැයි ඇතැම් භික්ෂුන් වහන්සේට කියා දී තිබීම ය. මේ පාර්ලිමේන්තුවේ භික්ෂුන් වහන්සේට කළහැකි විශේෂ දේශපාලනයක් නැත. දූෂණයට විරුද්ධවීම ගිහියනට ද කළ හැකි ය. ජ වි පෙ වැනි පක්ෂයකට එවැන්නක් කිසිම අපහසුවකින් තොරව ක්‍රියාත්මක කරවිය හැකි ය. මේ පිළිබඳ ව ගිය සතියේ ද කියා ඇත.

පාර්ලිමේන්තුවේ නියෝජනය වන දේශපාලන කණ්ඩායමේ නායක ස්වාමීන් වහන්සේ ජාතික හෙළ උරුමයේ නායකයා නොවෙති. මැතිවරණ කොමසාරිස්වරයා ලිපි ලේඛන යොමු කරන්නේ ගිහි නායකයකුට මිස භික්ෂුන් වහන්සේ නමකට නො වෙයි. උඩුවේ ධම්මාලෝක හිමියන්ට අනුව ජාතික හෙළ උරුමයෙන් තරගකළ භික්ෂුන් වහන්සේ තමන්වහන්සේගේ දාතම රහිත ඉල්ලා අස්වීමේ ලිපි දැනටමත් භාර දී ඇත. එසේ භාර දී ඇත්තේ ගිහි නායකයකුට බව ද පැහැදිලි ය. දේශපාලනය ශුද්ධ කර අස්වීම මන්ත්‍රී හාමුදුරුවරුන්ගේ අදහස විය හැකි ය. එය කරන්නේ කෙසේ ද, එයට කෙතරම් කල් ගතවේද ආදිය උන්වහන්සේ ඇතැම්විට දන්නවා ඇත. ඒ කෙසේ වෙතත් උන්වහන්සේ අස්වීමෙන් පසු පත්වන්නේ ගිහි මන්ත්‍රීවරු ය.

© Prof. Nalin De Silva

ජාතික හෙළ උරුමයෙන් පරස්පර අදහස් රාශියක් දැනටමත් මතු වී ඇත. ඇතැම් භික්ෂූන් වහන්සේට අනුව උන්වහන්සේ දිගට ම මන්ත්‍රීධුරයේ රැඳී සිටීමට අපේක්ෂාකරති. කථානායක ධුරයට එල්ලාවල මේධානන්ද හිමියන් පත්කරගන්නේ යැයි එක් මන්ත්‍රී හාමුදුරුනමක් ප්‍රකාශ කෙළේ ය. එහෙත් තිලක් කරුණාරත්න මහතා ඒ ධුරය සඳහා පළපුරුද්ද අවශ්‍ය බව පෙන්වා දීමෙන් පසු දේශපාලනය දන්නේ යැයි කියන ඒ භික්ෂූන් වහන්සේ නිශ්ශබ්ද වූහ.

විචිත්‍ර ධර්මකථික භික්ෂූන් වහන්සේ සෝම හිමියන්ගේ විවේචනයට භාජනය වුවාක් මෙන් ම උන්වහන්සේ අපවත්වීමට පෙර ජාතික ව්‍යාපාරයෙහි නොයෙදුණු සේක. මේ බව කීම පංචානන්තරීය පාප කර්මයක් නො වෙයි. එහෙත් එක් වයෝවෘද්ධ පැරණි වාමාංශිකයෙක් ලිපියක් ලියමින් මා භික්ෂූන් වහන්සේ විවේචනයට කර ඇතැයි කියා තිබුණි. අපට පශ්චාත්මාක්ස්වාදීන් යැයි ගරහන, අප ජාතිකත්වය නොදන්නේ යැයි කියන බලලෝභී අවස්ථාවාදී දේශපාලනඥයකු අනුගමනය කරන මොහු වැන්නන් සුදානම් වන්නේ මන්ත්‍රී හාමුදුරුවන් පාප් කාදිනල් තත්වයකට පත්කිරීමට ද? භික්ෂූන් වහන්සේ යනු පාප් තුමා මෙන් නොවරදින අය නො වෙති. එවැනි නොවරදිනසුළු සම්ප්‍රදායක් බුද්ධ ශාසනයේ නැත. විශේෂයෙන් ම දේශපාලනයට බව භික්ෂූන් වහන්සේ ගිහියන්ගේ විමසුමට භාජනය විය යුතු ය. අප ජාතිකත්වය නොදන්නේ යැයි කියන්නා ජාතිකත්වය ඉගෙනගත්තේ අපෙන් බව ඔහු සහ ඔහුගේ පමණක් ලිපි කියවන්නන් හැර සෙස්සෝ දනිති. භික්ෂූන් වහන්සේ රජුන් තනන්නන් මිස රජුන් වී නැතැයි අප පවසන්නේ ජාතිකත්වයට එකඟ ව ය. මේ පාර්ලිමේන්තුවේ භික්ෂූන් වහන්සේ කරන්නේ ද රජුන් තැනීමේ කටයුත්ත යැයි කවුදෝ පවසා තිබුණි. මේ රජුන් තැනීම යැයි කියන්නේ ඉංගිරිසි කිං මේකර්ස් යන අරුතින් මිස සිංහල අරුතකින් නො වෙයි. වචන පරිවර්තනයෙන් සම්ප්‍රදාය සැසඳිය හැකි නො වෙයි. තොණ්ඩමන් ද ඉංගිරිසි අරුතින් රජුන් තනන්නෙකි. අද හාමුදුරුවන් කරන්නේ ධාතුසේන රජු තැනූ මහානාම හිමියන්ගේ කාර්යය නොව තොණ්ඩමන්ගේ කාර්ය ය. තොණ්ඩමන්ගේ කාර්යය කළ යුත්තේ සිංහල බෞද්ධ ගිහියන් ය. ගිහියන් ඒ කාර්යය තොණ්ඩමන්ගෙන් ගතයුතු බව අප කියා සිටියේ 1994 දී ය.

කෙසේ වෙතත් ජාතික හෙළ උරුමය කඩන්නේ සන්ධානයේ ඡන්දවලට වඩා එ ජා ප ඡන්ද බව අපි මුල සිට ම කීවෙමු. එහෙත් සෝම හිමියන්ගේ අපවත්වීමෙන් පසුව අවිඥානික ව මතු වූ සිංහල බෞද්ධ ශක්තිය දෙස බලා විචිත්‍ර ධර්මකථිකයන් වහන්සේ පාර්ලිමෙන්තු දේශපාලනයට ඇද දැමූ විජාතික බලවේගවලට අවශ්‍ය වූයේ වෙනත් දෙයකි. එක් පැත්තකින් ඔවුන්ට අවශ්‍ය වූයේ ඉංගිරිසි ආණ්ඩුකාරයන් ගෙනගිය වැඩ පිළිවෙළ දිගට ම ගෙනයමින් භික්ෂූන්වහන්සේට තිබෙන සමාජ වගකීම නැතිකර දැමීම ය. මේ අතර ඇතැමුන්ට සන්ධානයේ ඡන්ද කැඩීමේ අවශ්‍යතාව ද විය. එ ජා පක්ෂයේ ප්‍රබලයකු කොළඹ විශ්ව විද්‍යාලයේ සිසුන් ද සහභාගි කරගනිමින් කරන ලද සමීක්ෂණයක දී හෙළි වී ඇත්තේ ජාතික හෙළ උරුමයට එ ජා පක්ෂයෙන් ඡන්ද තුනක් කැඩෙන විට සන්ධානයෙන් ඡන්ද අටක් කැඩෙන බව ය. ඕල්කට් බෞද්ධයන් වැඩිපුර ඡන්දය දෙන්නේ එ ජා පක්ෂයට බව දැන සිටියේ නම් ඊනියා සමීක්ෂණ අවශ්‍ය නො වෙයි. එ ජා පක්ෂය ගැන කළකිරී සිටි ජාතිකත්වයක් ගැන හැඟීමක් ඇති එමෙන් ම ජ වි පෙරමුණට කිසි දිනෙක ඡන්දය නොදෙන යම් පිරිසකට ජාතික හෙළ උරුමය නිර්මාණය වුවාක් වැනි ය. එහෙත් ඒ නිර්මාණය වූයේ ඒ සඳහා නොවන බව තේරුම් ගත යුතු ය. කෙසේ වෙතත් දැන් මැතිවරණය අවසන් ය. අනාගතය සඳහා කළ යුත්තේ කුමක් ද?

ජාතික හෙළ උරුමයට ප්‍රචාරක වාසි දෙන දූන්නේ කිනම් පුවත්පත් ද කිනම් රූපවාහිනී නාලිකා ද යන්න අපි දනිමු. සිංහල බෞද්ධයන් ප්‍රපාතයට හෙළන බුකි කරුවන් සිංහල බෞද්ධයන්ගේ කණකර උගසට ගන්නා ස්වර්ණාභරණ වෙළෙන්දන් අද සිංහල ජාතිකත්වය වෙනුවෙන් රඟපෑමක යෙදෙන බව අපි දනිමු. පණස්හයේ ආණ්ඩුව බලයට පත්වීමෙන් පසුව මෙරට තුරඟ තරඟ තහනම් කෙළේ ය. ඒ සඳහා සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයෙන් විශාල උද්ඝෝෂණයක් ද කෙරිණි. බෞද්ධ කොමිසම් සභා වාර්තාවෙන් ඒ නිර්දේශ වී තිබුණි. අද බෞද්ධ මහා සම්මේලනය නොකළ ද පණස්හයේ දරුවන් වූ ජාතිකත්වයක් ඇති මන්ත්‍රීවරුන්ට පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ලෙස බුකි තහනම සඳහා පණතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ හැකි ය. ජාතික හෙළ උරුමයේ මන්ත්‍රී හාමුදුරුවන් ද එයට ඡන්දය දෙනු ඇතැයි සිතමු.

අර්ජුන රණතුංග මහතාට ක්‍රීඩා ඇමතිකම නුදුන්නේ ඇයි ද යන ප්‍රශ්නයට ජනාධිපතිනිය දෙන පිළිතුර කුමක්දැයි දැනගැනීමට බොහෝ දෙනාට අවශ්‍ය වෙයි. රණතුංග මහතා එයට නුසුදුස්සකු යැයි කවුරුන් හෝ කියන්නේ ද? ක්ෂේත්‍රයේ අයකු ඇමති ධුරයට පත් කිරීම නුසුදුසු නම් නමට හෝ විද්‍යාඥයකු වූ තිස්ස විතාරණ මහතා විද්‍යා හා

© Prof. Nalin De Silva

තාක්ෂණ ඇමති ධුරයට නුසුදුසු වෙයි. රණතුංග මහතාට නැති පාර්ලිමේන්තු අත්දැකීම් විතාරණ මහතාට ඇතැයි අපි නො සිතමු.

ජාතික හෙළ උරුමය කලින් කීවේ කිසිම පක්ෂයකට ඡන්දය නොදෙන බව ය. එහෙත් දැන් කියන්නේ ආණ්ඩුවට සහාය දෙන බව ය. ආන්ඩුවට සහාය දීම වරදක් නොවේ. බොහෝ දෙනා පෙන්වා දී ඇති පරිදි ජනතා විමුක්ති පෙරමුණේ හා ජාතික හෙළ උරුමයේ ප්‍රතිපත්ති අතර එතරම් වෙනසක් නැත. අප මුල සිට ම කියා සිටියේ සිහල උරුමය (ජාතික හෙළ උරුමය නො වෙයි.) සන්ධානයට එකතු වී  සන්ධානයේ ජාතිකත්ව බලවේග ශක්තිමත් කළ යුතු බව ය. 1994 ට වඩා 2004 වෙනස් වන්නේ කෙසේ ද යන්න පිළිබඳ ව කලින් ලිපිවල සඳහන් කෙරී ඇත. එදා පොදු පෙරමුණට විරුද්ධ වුයේත් 2000න් පසු පොදු පෙරමුණට විවේචනාත්මක සහාය දෙන්නේත් ඇයි ද යන්න පිළිබඳ ව තවමත් තේරුම් ගැනීමට නොහැකි වූ අයෙක් වෙත් නම් ඒ තර්කයක් තේරුම් ගැනීමට හැකියාවක් නැත්තෝ වෙති.

ජාතික හෙළ උරුමය ආණ්ඩුවට සහාය දෙන්නේ බෞද්ධ කටයුතුවල දී පමණ ද? ඒ සඳහා වෙනත් කොන්දේසි වෙයි ද? අද ඇතැමුන් කප්පරක් දූෂණ මැරකම් හා අක්‍රමිකතා වසා ගැනීමට බෞද්ධකම යොදාගන්නා බව රහසක් නො වෙයි. සිංහල බෞද්ධකම යනු පව් වසා ගැනීමට ඇති සිල් රෙද්දක් නොවන බව තහවුරු කරගත යුතු ව ඇත. ආණ්ඩුව ඊනියා සිංහල බෞද්ධයන් රැකගත යුතු නො වෙයි. සිංහල බෞද්ධයන් තම සංවිධාන පිරිසිදු කරගත යුතු ය. ඇතැම් බෞද්ධ සංගම්වලට පත් වී ඇති නිලධාරීන් හා නිලධාරිනියන් ඒ සඳහා සුදුසු ද යන ප්‍රශ්නය අප නැගුවේ බොහෝ කලකට පෙර ය. එහෙත් ඒ සඳහා ඒ දිනවල වචනයකින් හෝ අපට ලැබුණු සහායක් නැත.

පණස්හයෙන් අපි පාඩම් ඉගෙනගත යුතු වෙමු. පණස් හයේ දී භික්ෂුන් වහන්සේගේ සහාය ආණ්ඩුවට ලැබිණි. එක්සත් භික්ෂු පෙරමුණ මහජන එක්සත් පෙරමුණේ ජයග්‍රහණය සඳහා වෙහෙසුනේ ය. බද්දේගම විමලවංශ හිමි, හේන්පිටගෙදර ඥානසීහ හිමි ආදී භික්ෂුන් වහන්සේ ජාතිකත්වය වෙනුවෙන් කටයුතු කළහ. එහෙත් ඒ අතර මාපිටිගම බුද්ධරක්ඛිත හිමි වැන්නෝ ද වූහ.කිසිසේත්ම අල්පේච්ඡ ජීවිතයක් ගතකෙළේ යැයි කිව නොහැකි උන්වහන්සේ ව්‍යාපාරිකයෝ වූහ. උන්වහන්සේ ආන්ඩුවෙන් ඇතැම් විට සිංහල බෞද්ධයාගේ යහපත සඳහා ද යම් යම් කාර්යයන් ආණ්ඩුව ලවා ඉටුකර ගැනීමට උත්සාහ ගන්නට ඇත. එහෙත් උන්වහන්සේලා ප්‍රධාන වශයෙන් ම මෙහෙයවනු ලැබුයේ විජාතික බලවේග විසිනි. නැව් සමාගමක් පිළිබඳ ඇති වූ ප්‍රශ්නයක් හේතුකොටගෙන බණ්ඩාරණායක මහතාගේ ජීවිතය පවා නැති කෙරිණි. අද ද එවැනි සුඛෝපභෝගී කාමරාගී ජීවිත ගතකරන භික්ෂුන් වහන්සේ විජාතික බලවේග විසින් මෙහෙය වෙති. උන්වහන්සේට එදාට වඩා අද ජනමාධ්‍ය ද ඇත. අද ඥානසීහ හිමි කවු ද, බුද්ධරක්ඛිත හිමි කවු ද යනුවෙන් තෝරා බේරා නොගෙන ජාතිකත්ව බලවේගවලට ඉදිරියට යා නො හැකි ය. එසේ තෝරා බේරා ගැනීමට ඉදිරිපත්වන්නවුන්ට ගල් පරලන්නෝ දේව්දත් ශ්‍රාවකයෝ වෙති.

ආණ්ඩුවේ අනාගතය තීරණය කරන ප්‍රධාන කරුන වන්නේ පොරොන්දු රැකිම ය. අද ජනතා විමුක්ති පෙරමුන හා ජනාධිපතිනිය අතර යම් ආරවුලක් ඇති වී තිබෙන බව පැහැදිලි ය. වහාම ඒ නිරාකරණය කරගත යුතු ය. නොයෙකුත් දෙනාට ජ වි පෙ ආණ්ඩුවෙන් එළවා ඒ ජා ප සමග ඊනියා ජාතික ආණ්ඩුවක් තැනීමේ ආශාව ඇති වී තිබෙයි. මේ යහපත් ප්‍රවනතාවක් නො වෙයි. ජනතා විමුක්ති පෙරමුණට වූ පොරොන්දු ඉටු නොකර ජනතාවට වූ පොරොන්දු ඉටු කරන්නේ කෙසේ ද? ආන්ඩුවේ සතුරන්ට අවශ්‍ය ආකාරයට ප්‍රශ්නය දිග්ගැස්සීමට ඉඩ නොදී වහා ම එකඟත්වයකට පැමිණිය යුතු ය.

මේ ආණ්ඩුව පිහිටුවනු ලැබුයේ සිංහල බෞද්ධයන් විසිනි. ජාතික හෙළ උරුමයට ද ඡන්දය දී ඇත්තේ ද බෞද්ධයන් බව අමුතුවෙන් කිවයුතු නො වෙයි. කවුරුන් කෙසේ කීව ද කවුරුන් කා විසින් මෙහෙයවනු ලැබුව ද 1994 ට වඩා 2004 වෙනස් ය. එදා අප තීරක බලවේගය වීම සඳහා මහජන එක්සත් පෙරමුණ සමග එක් වී තරග කළ අවස්ථාවේ ජනතාව අපට ඡන්දය නුදුන්හ.  එහෙත් අද එසේ නො වෙයි. ජ වි පෙ හා ජාතික හෙළ උරුමය කෙලින් ම ඒකීය ලංකාවක් වෙනුවෙන් පෙනී සිටියි. එයට අමතර ව මහජන එක්සත් පෙරමුණේ හා සිංහල මන්ත්‍රී සංධානයේ හා දේශ හිතෙතෂී ජාතික ව්‍යාපාරයට සහාය දැක්වූ මන්ත්‍රීවරු සිටිති. මගේ තක්සේරුව අනුව ඒකිය ලංකාවක්, ඊනියා එක්සත් ලංකාවක් නොව, සඳහා පෙනී සිටින මන්ත්‍රීවරු සියයක් පමණ පාර්ලිමේන්තුවේ සිටිති. මේ ජාතිකත්වයේ ජයග්‍රහණයකි. එහෙත් එයට අකුල් හෙලූ අය නැවතත් ප්‍රධාන තනතුරුවලට පත් කෙරෙති. ව්‍යවස්ථා සංශෝධනයක්

© Prof. Nalin De Silva

මුවාවෙන් ෆෙඩරල් හෙවත් සන්ධීය රාජ්‍යයක් ඇතිකිරීම සඳහා යමකු වෙහෙසෙන්නේ නම් ඒ තැත වහාම පරාජය කළ යුතු ය. අද ව්‍යවස්ථා සංශෝධන හා වෙනත් දෑ සම්බනධයෙන් මහතැන්වලට පැමින සිටින ඇතැම් ආචාර්ය මහාචාර්යවරු ජ වි පෙට හරස් කැපූ  හා ජනතා මතයට විරුද්ධ මතයක ඇත්තෝ වෙති. ඔවුන්ට යම් යම් වැඩ භාරදීම නරියාට කුකුළන් භාරදෙනු හා සමාන ය. මොවුන් ඒ ඒ තැන්වලින් ඉවත් කිරීම ආන්ඩුව ගෙනයෑමට අවශ්‍ය වූවන්ගේ කාර්යය වෙයි.

ජනතාව මනාප දීමේ දී තමන්ට අවශ්‍ය කුමක් දැයි පැහැදිලිව දක්වා ඇත. ජ වි පෙ මන්ත්‍රීවරු වැඩි මනාප ලැබුයේ ඔවුන් ශ්‍රී ලනි පට වඩා ජාතිකත්වය වෙනුවෙන් හා දූෂණයෙන් තොර ආණ්ඩුවක් සඳහා පෙනී සිටි බැවින් ය. ඔවුන්ට ශ්‍රී ල නි ප ඡන්ද ද ලැබී ඇති බව පැහැදිලි ය. ජනතාවගේ බලාපොරොත්තු නූතන බුද්ධරක්ඛිත හිමිවරුන් නිසා හෝ විජාතික බලවේගවල බලපෑම නිසා හෝ කඩ කළ යුතු නො වෙයි.  මෙහි දී නොකියාම බැරි දෙයක් වෙයි. මහින්ද රාජපක්ෂ මහතා සහ වෙනත් අය රාජ්‍ය නොවන ඒජන්තයන්ගෙන් ගැලවිය යුතු ය. ඒ අතර රාජපක්ෂ මහතා හා ජ වි පෙ අතර යම් නෝක්කඩුවක් වෙයි නම් ඒ දුරු කිරීමට වත්මන් විමලවංශ ඥානසීහ හිමිවරුන්ට ජාතියේ නාමයෙන් ඉදිරිපත්වන ලෙස ආරාධනය  කරමි.

© Prof. Nalin De Silva